# වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
# துறைமுகம் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
# Ministry of Ports and Civil Aviation

| මගේ අංකය<br>எனது இல<br>My Number | MP&CA/HDM/MS/18 | ඔබේ අංකය<br>உமது இல<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2026.09.16 |
|---|---|---|---|---|---|

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති සංස්කාරක**

**<u>ලෝක ශූර රුමේෂ් තරංග මහතාගේ ක්‍රීඩා උපකරණ වලට සිදුවූ හානිය සම්බන්ධයෙන් Turkish Airlines වෙතින් කරුණු විමසයි</u>**

World Athletics Ultimate Championship ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රන් පදක්කම දිනා ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් ලෝක ශූර රුමේෂ් තරංග මහතා මෙරටට පැමිණීමේදී ඔහුගේ ක්‍රීඩා උපකරණ වලට සිදුව ඇති හානිය සම්බන්ධයෙන් Turkish Airlines ආයතනයෙන් කරුණු විමසීමක් සිදු කෙරිණි.

ඒ අනුව, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් වරාය හා සිවිල් ගුවන්සේවා නියෝජ්‍ය අමාත්‍ය ජනිත් රුවන් කොඩිතුවක්කු මහතාගේ ප්‍රධානත්වයෙන්, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්.ඩබ්ලිව්.එස්. මංගල මහතා, සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කපිතාන් දමින්ද රඹුක්වැල්ල මහතා සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ සභාපති විශ්‍රාමික කර්නල් රංජිත් රාජසිංහ මහතා, Turkish Airlines ආයතනයේ නියෝජිතයින් පිරිසක් සමඟ සාකච්ඡාවක් ඊයේ (15)වන දින සිවිල් ගුවන්සේවා අධිකාරී පරිශ්‍රයේදී පැවැත්වුණි.

මෙහිදී, රුමේෂ් තරංග මහතාගේ ක්‍රීඩා උපකරණ වලට සිදුව ඇති හානිය පිළිබඳ Turkish Airlines ආයතනයේ නියෝජිතයින් සිය කනගාටුව පළ කළ අතර, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනික විමර්ශන කටයුතු සිදු කිරීමට ද, එම හානිය පිළිබඳව නිසි ඇගයීමක් සිදු කරන ලෙසත්, අදාළ හානිය කඩිනමින් ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් මෙහිදී තීරණය විය.

**මාධ්‍ය අංශය**
**වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය**


වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව
துறைமுகம் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
எண். 19, சைத்யா சாலை, கொழும்பு 01, இலங்கை
Ministry of Ports & Civil Aviation
No. 19, Chaithya Road, Colombo 01, Sri Lanka

ලේකම් / செயலாளர் / Secretary: +94 (0) 11 2320252
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: secretary@portmin.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office: +94 (0) 112439352
ෆැක්ස් / தொலைநகல் / Fax No: +94 (0) 11 2435134